# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89— 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාද — 1973.12.07

( ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී )


# I වැනි කොටස: (III) වැනි ජේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | ... 239 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... | ... — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... | ... 241 | විවිධ දැන්වීම ... ... ... | ... — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... | ... — | | |


සැලකිය යුතුයි.—පොලිස් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 නොවැම්බර් මස 30 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වාද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද , භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු, ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### ''ඒ'' කොටසේ හෝ ''බී'' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ '' ඒ '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ '' බී '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් '' බී '' අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡන මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරණ පෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැක්ය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම් අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සැහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.

විරෝධතාක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණ් අංකය : 29,928. (2) ලැබුණ දිනය : 1968 ජනවාරි මස 23 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : වෙම්වේ කොර්පරේෂන් (ඇමරිකා එක්සත් ජනපදයේ ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංස්ථාපිත සංයුක්ත මණ්ඩලයකි) fෙපයාර්fපිල්ඩ් පාරේ එහි ලියාපදිංචි කාය්‍යාලය පිහිටි, වේන්, නිව් ජර්සි, 07470, ඇමරිකා එක්සත් ජනපදය; නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ඩී. එන්. තුරෙයිරාජා මයා, තැ. පෙ. 1464, කොළඹ. (5) පන්තිය : 48. (6) සුවඳ කැවූ කොලෝං. (7) වෙළඳ ලකුණේ සටහන :




ජේ. එf්ජ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1970 ජූලි මස 15 දින.

12–201—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,545. (2) ලැබුණ දිනය : 1971 මැයි මස 15 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ද කොකා—කෝලා කම්පනි (ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංස්ථාවකි) එන්. ඩබ්ලිව්. උතුරු මාවතේ අංක 310 දරණ ස්ථානයේ කාර්යාලය පිහිටි, ඇට්ලන්ටා නගරය, ජෝර්ජියා රාජ්‍යය 30313, ඇමරිකා එක්සත් ජනපදය : නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ජුලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 42. (6) බඩු : පාන වර්ග සහ පාන වර්ග සෑදීම පිණිස සම්මිශ්‍රණ. (7) වෙළඳ ලකුණේ සටහන:

**SONFIL**

ආර්. එල්. ද සිල්වා
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 අගොස්තු මස 15 දින.

12–205/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 31,833. (2) ලැබුණ දිනය : 1969 අගෝස්තු මස 29 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : රිචඩ්සන්–මෙරල් ඉන්ක් (ඇමරිකා එක්සත් ජනපදයේ ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංයුක්ත මණ්ඩලයකි) අංක 122 නැගෙනහිර 42 වන වීථියේ කාය්‍යාලයන් පිහිටි, නිව්යෝර්ක් එන්. වයි. 10017 ඇමරිකා එක්සත් ජනපදය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ජුලියස් සහ ක්‍රිසි මහතුන්, තැ.පෙ. 154, කොළඹ. (5) පන්තිය : 3. (6) බඩු : ඖෂධීය සහ භෛසජ්ජික නිෂ්පාදනය සහ ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන :

KOLANTYL

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,1972 ඔක්තෝබර් මස 24 දින.

12–205/2—73.12.07 දින අංක 89 දණෙ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 31,565 : (2) ලැබුණ දිනය : 1969 ජූනි මස 18 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : fපයිසර් කෝර්පරේෂන් (පැනමා ජනරජයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සමාගමකි.) ඇවනිඩා සැන්ට් ඉසබෙල්හි, කැලිහි අංක 15½ දරණ ස්ථානයේ කාර්යාලයක් පිහිටි,කොලොන්, පැනමාව, නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ජුලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 3. (6) බඩු : ඖෂධීය සහ භෛසජ්ජික නිෂ්පාදන. (7) වෙළඳ ලකුණේ සටහන :




මෙම වෙළඳ ලකුණ අංක 16,699 දරණ වෙළඳ ලකුණ හා සම ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 මැයි මස 12 දින.

12–205/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

# වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

### ශුද්ධියකි

අංක 31 හා 1973 ඔක්තෝබර් මස 12 වෙනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 34,163 හා 1972 පෙබරවාරි මස 9 දින දරණ 13 වෙනි පන්තියේ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ අංක (3) පහත සඳහන් පරිදි නිදෙස් විය යුතුය:—

අංක (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): මෝල්ටන් ඩිවලොප් මන්ට්ස් ලිමිටඩ්, (මහා බ්‍රිතාන්‍යයේ නීති යටතේ විධිමත්ව සංස්ථාපිත ඒකාබද්ධ මණ්ඩලයකි) ද හෝල්, බ්‍රැඩ්ෆර්ඩ්-ඔන්-ඇවොන්, විල්ට්ෂයර්, එංගලන්තය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

1973 නොවැම්බර් මස 05 වැනි දින,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව.

12–71—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### ශුද්ධියකි

අංක 61 හා 1973 මැයි මස 25 වන දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අංක 32,916 හා 1970 අගෝස්තු මස 12 දින දරණ 2 වන පංතියේ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ 7 වන අංකය පහත සඳහන් අයුරින් නිදෙස් විය යුතුය.

7 වන අංකය (වෙළඳ ලකුණේ සටහන) : **ATHLEFT**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

1973 නොවැම්බර් මස 14 වැනි දින,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ .

12–5—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශොධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෙ/ද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ සුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගනුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළ කරන්නට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අහලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු– :—

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| ! වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| ! වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (!) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (!!) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (!) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, ! වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (!!) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, ! වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | 0 | 15 |

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | ... | 73.11.02 | සිකුරාද | ... | 73.10.26 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.11.09 | සිකුරාද | ... | 73.11.02 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.11.16 | සිකුරාද | ... | 73.11.09 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.11.23 | සිකුරාද | ... | 73.11.16 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.11.30 | සිකුරාද | ... | 73.11.23 | සිකුරාද | දවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.07 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දවල් | 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.